මාතර ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූල 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතර ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි 08 ක වටිනාකම වූ රු.9,000,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.866,503 ක් වූ තොගවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට දක්වා නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයට ලැබිය යුතු මුද්දර ගාස්තු වල වටිනාකම රු.3,986,623 ක් ලෙස ගිණුම් ගතකර තිබුණු අතර 2012 වර්ෂයේ තථ්‍ය මුද්දර ගාස්තු ලැබීම්වල එකතුව රු.4,466,133 ක් විය. මෙම මුද්දර ගාස්තු ඌණ වෙන්කිරීම් රු.479,510 ක මුදල ගිණුම්වල ගලපා නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේ මැයි සිට දෙසැම්බර් උසාවි දඩ මුදල් රු.200,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද 2012 වර්ෂය තුල තථ්‍ය ලැබීම රු.950,637ක් විය. රු.750,637 ක්වූ මෙම ඌන වෙන්කිරීම ගිණුම්වල ගලපා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයගැති උපලේඛණයේ ඇතුළත් ඩෝසර් කන්ද දෙවන අතුරු මාර්ගය සඳහා ලැබිය යුතු මුදල රු.500,000 කින් අඩුවෙන් සටහන් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැතියෝ එම ප්‍රමාණයට අඩුවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සභාව සතු මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුම් 04 ක පැවති රු.441,048 ක් වූ මුදල් ශේෂයයන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල රු.8,313,442 ක් වටිනාකම වූ වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ආපසු ලබාදී ඇතත් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට අදාල ගැලපීම් ගිණුම්වල සිදුකර නොතිබුණි.

(ඌ) සභාව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමෙන් 2011 සැප්තැම්බර් 15 දින රු.2,500,000 ක් වටිනා ස්ථාවර තැන්පත් 3 ක මුදල් ආයෝජනය කර තිබුණි. මෙම ස්ථාවර තැන්පත් 03 න් එක් තැන්පතුවක් 2011 සැප්තැම්බර් මාසයේදීම රු.1,008,630 ක් ලෙසට හා 2012 ජනවාරි 01 දින තවත් තැන්පතු දෙකක් රු.1,530,091 ක් ලෙසට නැවත මුදල් කර ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,500,000 ක් ලෙසට එකී තැන්පතු අගය දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.47,981,064 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.51,627,936 ක් වූ බැවින් රු.3,646,872 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,942,225 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.37,701,118 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුළත් රු. 113,807,776 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,296,972 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.7,311,174 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 755 | 445 | 827 |
| (ii) | බදුකුලී | 3,711 | 3,371 | 526 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,449 | 811 | 21 |

#### 2.2.2 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ නාවිමන, මාකාවිට, කැකනදුර, හා වැවහමන්දූව යන ප්‍රදේශ 03 හි වරිපනම් බදු ගෙවන දේපල සංඛ්‍යාව 3,101 ක් වූ අතර වරිපනම් අයකිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට එකී ප්‍රදේශවලින් හිඟහිටි මුදල රු.757,249 ක් විය.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | රු. 360,000 |
| (ii) | මුද්දර ගාස්තු | රු. 900,000 |

## 2.3 අවිධිමත් ගනුදෙනු

(අ) 2013 අප්‍රේල් 22 දිනැති අංක 1807/2 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ විධිවිධාන අනුව මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරි ඇති කාර්යයන්/සභාව විසින් පවරන ලද කාර්යයන් වෙනුවෙන් ගමන් වියදම් දීමනාවක් ලබාගත හැකි බව සඳහන්ව තිබුණද එලෙස කිසිදු කාර්ය පැවරුමක් සිදු නොකර මන්ත්‍රීවරුන් 18 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.603,000 ක ගමන් වියදම් දීමනා ගෙවා තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 23 දිනැති අංක ද.ප.පා/ආ/05/06 දරන පොදු ලිපියකට අනුව දුරකථන බිල්පත් ගාස්තු ගෙවීමේදී කාඩ්පත් සම්බන්ධයෙන් දුරකථන සම්බන්ධතාවය තහවුරු කරවාගෙන මාසිකව රු.1,000 ක කාඩ්පත් සභාව විසින් මිලට ගෙන ලබාදීම කළයුතු වුවත්, එසේ නොකර එක් වවුචරයකින් මාසයකට රු.19,500 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු.234,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ 7.3 (1) (1) රීතිය පරිදි මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීමේදී අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී වී නොමැත වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොමැති මන්ත්‍රීවරුන්ට දීමනා සම්බන්ධයෙන් හිමිකම් නොලැබුවද එකී රීතියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට රු.65,000 ක මුදලක් ගෙවා තිබුණි.

## 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 2.4.1 මාර්ග නඩත්තු ඒකකයේ වාහන යෙදවීම

(අ) මාර්ග නඩත්තු ඒකකයේ ජේ.සී.බී. යන්ත්‍රය, මාර්ග තලනය හා ට්‍රැක්ටරය පසුව මුදල් ලබාගැනීමේ පදනම මත දීර්ඝ කාලයක සිට සේවයේ යොදවා තිබූ අතර මුදල් අයකර ගැනීමේ දීර්ඝ කාල පමාවක් තිබුණි.

(ආ) මෙම වාහන මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීම මත විවිධ පුද්ගලයන් වෙත ලබාදී තිබූ අතර සභාව මගින්ද පුද්ගලයින් වෙත ලබාදී තිබුණි. 2012 සැප්තැම්බර් 31 දින වන විට ජේ.සී.බී. යන්ත්‍රයෙන් රු.305,369 ක්ද මාර්ග තලනයෙන් රු.175,000 ක්ද, ට්‍රැක්ටරයෙන් රු.13,720 ක්ද වශයෙන් රු.494,089 ක මුදලක් අයවීමට තිබුණි.

---

2.4.2 දේපල ණය පොලී

2005 මාර්තු 31 දින අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4 ක පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් දරනු ඇත යන්න දක්වා ඇතත් නිලධාරීන් 09 දෙනෙක් ලබාගෙන තිබූ ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,203,090 ක මුදලක් සභා අරමුදලෙන් ගෙවා තිබූ නමුත් එකී මුදල 2013 සැප්තැම්බර් 25 දින දක්වා ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

2.4.3 වීථි පහන් නඩත්තුව හා පාලනය

විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම් 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛ ලිපිය පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු කාර්යය සිල්ලර පරිභොජනය සියයට 3 ක ප්‍රමාණයක් නොඉක්ම විය යුතු බව දක්වා තිබුණද සභාව එකී සීමාව ගණනය කර වීථි පහන් සවි කිරීම සඳහා ලංකා විදුලිය බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත බැඳීම් ඇතිකර ගෙන නොතිබුණි.

2.4.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ අතර සංයුක්ත සැලැස්මේ ඇතුලත් දැ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.4.5 වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි සභාවේ උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 06 දෙනෙකු 2012 වර්ෂයේදීද වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය

2.5.1 අනුමත සේවක සංඛ්‍යාව

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව 40 දෙනෙක් සඳහා සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.12,438,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගෙන තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු.24,068,021 ක් වූයෙන් සභා අරමුදලට රු.11,630,021 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ආ) 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීමඅත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 23 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.5,491,096ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද එහි අවධාරණය කර තිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

-----------------------

සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වෙනම අංශයක් පිහිටුවීම හෝ සුදුසුකම් ඇති පුද්ගලයෙකු පත්කර ගැනීම කර නොතිබුණි. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2005 නොවැම්බර් 08 දිනැති පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි 08 ඡේදය පරිදි සභාවේ අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් අවධානය යොමුව නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය